**පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ 2026.02.11 වන දින පැවැති මහ සභා රැස්වීම් වාර්තාව.**

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ මහා සභා රැස්වීම 2026 පෙබරවාරි මස 11 වන දින පෙ.ව.10.00 ට ගරු සභාපති එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පවත්වන ලදී.

ඒ සඳහා පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන් හා මන්ත්‍රීවරියන් සහභාගී විය.

| | | | |
|---|---|---|---|
| 02. | ගරු ප්‍රාදේශීය සභා උප සභාපති | - | එච්.ජී.නලින් සේනක මාගම්මන මැතිතුමා. |
| 03. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.ඩී.ඩබ්.සෝමරත්න මැතිතුමා |
| 04. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එච්.එම්.සරත් උෂාන් මහානාම මැතිතුමා. |
| 05. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ඩී.රුවන් චානක පියරත්න මැතිතුමා. |
| 06. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.වී.නිර්මික දීපාල් අබේවර්ධන මැතිතුමා. |
| 07. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ජී.චන්ද්‍රලාල් මැතිතුමා. |
| 08. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.එල්.ඉන්දික ගයාන් ලියනගේ මැතිතුමා. |
| 09. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා. |
| 10. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එම්.ඒ.පුෂ්පකුමාර ධනසේකර මැතිතුමා. |
| 11. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා. |
| 12. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | ඩබ්.එම්. ශ්‍රියානි වීරසේකර මැතිතුමිය. |
| 13. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා. |
| 14. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ටී.කේ.සම්පත් සිරිශාන්ත මැතිතුමා. |
| 15. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩී.එල්.යුරේෂ් පුෂ්පකුමාර මැතිතුමා. |
| 16. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.වසන්ත කුමාරසිරි මැතිතුමා. |
| 17. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ජී.ඉන්දික කුමාර මැතිතුමා. |
| 18. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.එම්.ඒ.ඉසුරු සම්පත් අලගියවන්න මැතිතුමා. |
| 19. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | බී.තුෂාරි දමයන්ති සිල්වා මැතිතුමිය. |
| 20. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | එච්.ඥානලතා හපුතන්ත්‍රි මැතිතුමිය |
| 21. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | එම්.සුලාරි සඳරේඛා මාකාවිට මැතිතුමිය. |
| 22. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා. |
| 23. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.ඉන්දික උදයකුමාර ගුණවර්ධන මැතිතුමා. |
| 24. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | මංජු ඩයස් වික්‍රමනායක මැතිතුමා. |
| 25. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.එෆ්.ජගත් සේනාරත්න මැතිතුමා. |
| 26. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | බී.නිශාන්ත කුමාර බුද්ධාරච්චි මැතිතුමා. |
| 27. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | ටී. ශ්‍රියානි ජානකී පීරිස් මැතිතුමිය. |
| 28. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | රාජරත්නම් පුවනේස්වරී මැතිතුමිය. |
| 29. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | එම්.ප්‍රදීපා ඉඳුමිණි කුලරත්න මැතිතුමිය. |
| 30. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | වෙරංජා කාමනී විජේරත්න මැතිතුමිය. |
| 31. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.ඩබ්.මොහාන් මංජුල මැතිතුමා |
| 32. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.තිෂෝක් මැතිතුමා |
| 33. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.පී.ශාන්ත කුමාර කුඩාවත්ත මැතිතුමා |
| 34. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා |
| 35. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | මයුරි චතුරිකා පරණමාන්න මැතිතුමිය |
| 36. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.ධනේශ් කුමරන් මැතිතුමා |
| 37. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.ජෙගන් මෝහන් මැතිතුමා |

පැමිණ සිටි සියලු දෙනාම ආගම සිහි කර , ගරු සභාපතිතුමන් විසින් අද දින මහා සභා රැස්වීම සඳහා පැමිණ සිටින ගරු උප සභාපති තුමා, ගරු විපක්ෂ නායකතුමා ඇතුළු පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලා ද, ලේකම්තුමා හා නිලධාරීතුමිය ද පිළිගැනීමෙන් අනතුරුව සභාවේ කටයුතු ආරම්භ කරන ලදී.

**01.2026.01.14 සභා වාර්තාව සභා සම්මත කිරීම.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජෙගන් මෝහන් මැතිතුමා විසින් කාර්මික සේවා කාරක සභාව හා නිවාස හා ප්‍රජා සංවර්ධන කමටුවෙන් හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ධනේශ් කුමරන් මැතිතුමා මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවෙන් ඉල්ලා අස්වන ලදි.

ඉහත සංශෝධනයන් වලට යටත්ව 2026.01.14 දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්.ඉන්දික ගයාන් ලියනගේ මැතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසුව ඒකමතිකව සභා සම්මත විය.

02. **සභාපතිවරයා විසින් සභාව වෙත ඉදිරිපත් කළ යුතු නිවේදන.**

2025 අවසන් ගිණුම සභාවට ඉදිරිපත් කිරීම වෙනුවෙන් පෙබරවාරි මස අවසානයේ විශේෂ මහා සභාවක් පැවැත්වීමට තීරණය කර ඇත.

**03.සභා රැස්වීමට නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා - නැත**

**04.ගරු සභාව අමතා එවන සංදේශ, මහජන පෙත්සම්/පැමිණිලි සභාව ඉදිරියේ තැබීම- නැත**

**05.යථා පරිදී කල් දී ඇති ප්‍රශ්න -නැත**

**06.යථා පරිදී කල් දී ඇති යෝජනා**

**I.ගරු සභාපති එම්.ජී.ඒ. ධර්මසිරි මාණිපුර මැතිතුමාගේ යෝජනා.**

01. 2025 වර්ෂය සඳහා සිදු කරන ලද භාණ්ඩ සමීක්ෂණයට අදාලව එම සමීක්ෂණ මණ්ඩලය විසින් ලබා දී ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා සහා අනුමැතිය ලබා දීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්.ඉන්දික ගයාන් ලියනගේ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා පවසා සිටියේ 2025 වර්ෂය සඳහා සිදු කරන ලද භාණ්ඩ සමීක්ෂණයට අදාලව එම සමීක්ෂණ මණ්ඩලය විසින් ලබා දී ඇති නිර්දේශ පිළිබඳව නිරීක්ෂණයක් සිදු කළ යුතු බවයි.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්.ඉන්දික ගයාන් ලියනගේ මැතිතුමා පවසා සිටියේ මෙම වාර්තාව ඉදිරිපත් කිරීමට දින වකවානු පවතින බවත්,මාර්තු 15 වන විට භාණ්ඩ සමීක්ෂණයට අදාළ සියලු කටයුතු අවසන් කළ යුතු බවය.නිරීක්ෂණ නිර්දේශ ලෙස සඳහන් වන්නේ සමහර දේවල් වල ඌණතා හා සටහන් තැබීමේ දුර්වලතා,අත්හැරීම් දෝෂ ආදියයි.කමිටුවක් වගකීම වන්නේ මෙම අඩු පාඩු පෙන්වා දිය යුතු බවයි.දිගු කාලයක් නොගෙන මෙම කටයුතු අවසන් කළ යුතු බවයි.

නමුත් නිසිකාලය වන විට භාණ්ඩ සමීක්ෂණයට අදාළ සියලු කටයුතු අවසන් කළ යුතු බැවින් මෙම නිර්දේශ ක්‍රියාත්මක කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා පවසන ලදි.

**තීරණ අංක 01**

2025 වර්ෂය සඳහා සිදු කරන ලද භාණ්ඩ සමීක්ෂණයට අදාලව එම සමීක්ෂණ මණ්ඩලය විසින් ලබා දී ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා සහා අනුමැතිය ලබා දීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

02.2025 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු වලට ආදාළව පහත නම් සඳහන් කමිටු සාමාජිකයින්ගෙන් සමන්විත තක්සේරු කමිටුව, වෙන්දේසි කමිටුව, අපහරණ කමිටුව පත් කිරීමට යෝජනා කරමි.

තක්සේරු කමිටුව

| | |
|---|---|
| ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා | - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| කේ.ඩබ්.එම්.එස්.ටී.එස්.ආනන්ද මයා | - යාන්ත්‍රික ඉංජිනියර් |
| එම්.ජී.එස්.මල්ලිකා මිය | - ප්‍රජා සංවර්ධන නිලධාරී (අධීක්ෂණ නිලධාරී) |
| ජේ.එම්.එස්.කේ.බණ්ඩාර මයා | - ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී |
| බී.එම්.අයි.එස්.යෝගරත්න මයා | - කාර්මික නිලධාරී |
| කේ.එම්.එන්.ගුණරත්න මිය | - ආදායම් පරීක්ෂක |

වෙන්දේසි කමිටුව

| | |
|---|---|
| ඩබ්.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා | - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| එම් .ජී.එස්.මල්ලිකා මිය | - ප්‍රජා සංවර්ධන නිලධාරී |
| එස්.රත්නාවතී මෙය | - සංවර්ධන නිලධාරී |
| ජේ.උපනන්ද මයා | - සංවර්ධන නිලධාරී |
| ඩබ්.එම්.ටී.හර්ෂණී මිය | - සංවර්ධන නිලධාරී |
| ඩබ්.ඩී.ආර්.විජේරත්න | - සංවර්ධන නිලධාරී |

අපහරණ කමිටුව

| | |
|---|---|
| ඒ.එෆ්.ජගත් සේනාරත්න මැතිතුමා | - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| එම්.ජී.එස්.මල්ලිකා මිය | - ප්‍රජා සංවර්ධන නිලධාරී |
| ඒ.බී.එස්.සේනාරත්න මිය | - සංවර්ධන නිලධාරී |
| එම්.වී.ඒ.පුෂ්පසූරිය මිය | - සංවර්ධන නිලධාරී |
| කේ.එම්.ඩී.එස්.සෙනෙවිරත්න මිය | - සංවර්ධන නිලධාරී |
| ආර්.ඒ.ඩී.බී.රණසිංහ මිය | - සංවර්ධන නිලධාරී |

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.පුෂ්පකුමාර ධනසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා පවසා සිටියේ මෙම කමිටු තුන සඳහා තවත් මන්ත්‍රීවරුන් තිදෙනෙකුගේ නම් ඇතුලත් විය යුතු බවයි.

**තීරණ අංක 02**

2025 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු වලට අදාළව තක්සේරු කමිටුව සඳහා බී.නිශාන්ත කුමාර බුද්ධාරච්චි මැතිතුමා, වෙන්දේසි කමිටුව සඳහා ආර්.ධනේශ් කුමරන් මැතිතුමා, අපහරණ කමිටුව සඳහා ඩබ්.ඉන්දික උදයකුමාර ගුණවර්ධන මැතිතුමා ඇතුළුව පහත සඳහන් කමිටු සාමාජිකයින්ගෙන් සමන්විත තක්සේරු කමිටුව, වෙන්දේසි කමිටුව, අපහරණ කමිටුව පත් කිරීම සුදුසු බව ඒකමතිකව සහා සම්මත විය.

තක්සේරු කමිටුව

| | |
|---|---|
| ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා | - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| කේ.ඩබ්.එම්.එස්.ටී.එස්.ආනන්ද මයා | - යාන්ත්‍රික ඉංජිනියර් |
| එම්.ජී.එස්.මල්ලිකා මිය | - ප්‍රජා සංවර්ධන නිලධාරී (අධීක්ෂණ නිලධාරී) |
| ජේ.එම්.එස්.කේ.බණ්ඩාර මයා | - ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී |
| බී.එම්.අයි.එස්.යෝගරත්න මයා | - කාර්මික නිලධාරී |
| කේ.එම්.එන්.ගුණරත්න මිය | - ආදායම් පරීක්ෂක |

වෙන්දේසි කමිටුව

ඩබ්.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
එම් .ජී.එස්.මල්ලිකා මිය - ප්‍රජා සංවර්ධන නිලධාරී
එස්.රත්නාවතී මෙය - සංවර්ධන නිලධාරී
ජේ.උපනන්ද මයා - සංවර්ධන නිලධාරී
ඩබ්.එම්.ටී.හර්ෂණී මිය - සංවර්ධන නිලධාරී
ඩබ්.ඩී.ආර්.විජේරත්න - සංවර්ධන නිලධාරී

අපහරණ කමිටුව

ඒ.එෆ්.ජගත් සේනාරත්න මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
එම්.ජී.එස්.මල්ලිකා මිය - ප්‍රජා සංවර්ධන නිලධාරී
ඒ.බී.එස්.සේනාරත්න මිය - සංවර්ධන නිලධාරී
එම්.වී.ඒ.පුෂ්පසූරිය මිය - සංවර්ධන නිලධාරී
කේ.එම්.ඩී.එස්.සෙනෙවිරත්න මිය - සංවර්ධන නිලධාරී
ආර්.ඒ.ඩී.බී.රණසිංහ මිය - සංවර්ධන නිලධාරී

03. රියදුරු ලෙස සේවය කළ එම්.ජී. චන්ද්‍රසේන මයාගෙන් අය කරගත නොහැකිව ලේඛනගතව ඇති රු.42,730.50කට අදාළව සිදු කරන ලද මු.රෙ.104(4) පරීක්ෂණ වාර්තාවේ නිර්දේශ අනුව එම මුදල කපා හැරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතියට ඉදිරිපත් කිරීම පිණිස සහා තීරණයක් ලබා ගැනීම සඳහා ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.ඒ.ඉසුරු සම්පත් අලගියවන්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 03**

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ රියදුරු ලෙස සේවය කළ එම්.ජී. චන්ද්‍රසේන මයාගෙන් අය කරගත නොහැකිව ලේඛනගතව ඇති රු.42,730.50කට අදාළව සිදු කරන ලද මු.රෙ.104(4) පරීක්ෂණ වාර්තාවේ නිර්දේශ අනුව එම මුදල කපා හැරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

04.2024 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද කොම්පෝස්ට් අංගනයේ ගළි වලවල් සඳහා වහළය ඉදි කිරීම හා පවතින වහළයේ වැහි පීළි සහිත අඩුපාඩු සකස් කිරීමේ ව්‍යාපෘතියට අදාළව වැඩ අවසන් බිල්පතට අදාල රු.3,732,258.32ක මුදල කාර්යාලයට ලැබී ඇති බැවින් එම මුදල කොන්ත්‍රාත්කරු, හල්පාවල ග්‍රාම සංවර්ධන සමිතිය වෙත නිදහස් කිරීම සඳහා අනුමැතියට ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

කොම්පෝස්ට් අංගනයේ ගලි බැහැරලීම් අංගනයක් සැකසීම සුදුසු බවත්,ඒ මඟින් පැල්මඩුල්ල ජනතාවට මහත් සහනයක් සැළසෙන බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා පවසන ලදී.

**තීරණ අංක 04**

2024 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද කොම්පෝස්ට් අංගනයේ ගළි වලවල් සඳහා වහළය ඉදි කිරීම හා පවතින වහළයේ වැහි පීළි සහිත අඩුපාඩු සකස් කිරීමේ ව්‍යාපෘතියට අදාළව වැඩ අවසන් බිල්පතට අදාල රු.3,732,258.32ක මුදල කාර්යාලයට ලැබී ඇති බැවින් එම මුදල කොන්ත්‍රාත්කරු, හල්පාවල ග්‍රාම සංවර්ධන සමිතිය වෙත නිදහස් කිරීම සුදුසු බව ඒකමතිකව සහා සම්මත විය.

05.පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ ශ්‍රමය මිලදී ගැනීමේ පදනම මත මාස 03න් 03ට සේවය බණ්ඩනය වන අයුරින් බඳවා ගත් ඩබ්.සුමිත් මයා, ජේ.එන්.ගයාන් ලක්මිණ මයා, රාජා උදයකුමාර් මයාගේ සේවා ගිවිසුම් කාලය මාස 03කින් දීර්ඝ කිරීමට අනුමැතිය සඳහා ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.තිෂෝක් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 05**

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ ශ්‍රමය මිලදී ගැනීමේ පදනම මත මාස 03න් 03ට සේවය බණ්ඩනය වන අයුරින් බඳවා ගත් පහත නම් සඳහන් සේවකයින්ගේ සේවා ගිවිසුම් කාලය මාස 03කින් දීර්ඝ කිරීම සුදුසු බව ඒකමතිකව සහා සම්මත විය.

| නම | තනතුර | සේවා ගිවිසුම් කාලය |
|---|---|---|
| ඩබ්.සුමිත් මයා | සෞඛ්‍ය කම්කරු | 2026.02.11-2026.05.11 |
| ජේ.එන්.ගයාන් ලක්මිණ මයා | සෞඛ්‍ය කම්කරු | 2026.02.20-2026.05.20 |
| රාජා උදයකුමාර් මයා | සෞඛ්‍ය කම්කරු | 2026.02.11- 2026.05.11 |

**II.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඩබ්.එම්.ශ්‍රියානි වීරසේකර මැතිතුමියගේ යෝජනා.**

01. හේන්යාය දොඹගස්වින්න ග්‍රාම නිලධාරී වසමේ පදිංචි පී.එච්.සුරංජි දර්ශනී මහත්මියගේ නිවස වහළ මට්ටමට ඉදි කර ඇති කාමර 02 හා සාලය සඳහා සෙවිළි තහඩු අවශ්‍යා වී ඇත.මිදිගහමුල්ල මහජන පුස්තකාලය අලුත්වැඩියා කිරීමේදී ඉවත් කරන ලද පරණ වහළයේ සෙවිළි තහඩු පී.එච්.සුරංජි දර්ශනී මහත්මියට ලබා දීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා උප සභාපති එච්.ජී.නලින් සේනක මාගම්මන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

පැරණි සෙවිළි තහඩු වෙනුවට අලුත් සෙවිළි තහඩු ලබා දීමට හැකිනම් එය වඩාත් සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී

ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා පවසන ලදි.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා උප සභාපති එච්.ජී.නලින් සේනක මාගම්මන මැතිතුමා විසින් සෑම කොට්ඨාශයකම නිවසක් තනා ගැනීමට නොහැකිව අසරණ වුණ පවුල් තෝරාගෙන කොට්ඨාශයකින් දෙදෙනෙකුටවත් සෙවිළි තහඩු ලබා දෙන ලෙසට ඉල්ලීමක් සිදු කරන ලදි

**තීරණ අංක 06**

හේන්යාය දොඹගස්වින්න ග්‍රාම නිලධාරී වසමේ පදිංචි පී.එච්.සුරංජි දර්ශනී මහත්මියගේ නිවස වහළ මට්ටමට ඉදි කර ඇති කාමර 02 හා සාලය සඳහා මීදිගහමුල්ල මහජන පුස්තකාලය අලුත්වැඩියා කිරීමේදී ඉවත් කරන ලද පරණ වහළයේ භාවිතයට ගත හැකි සෙවිළි තහඩු ලබා දීම සුදුසු බවට සභා සම්මත විය.

**III.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.ඒ.ඉසුරු සම්පත් අලගියවන්න මැතිතුමාගේ යෝජනා.**

01.මේ වන තෙක් 2026 වර්ෂයට අදාළව ට්‍රැක්ටර් රථ ඇතුළු වාහන අලුත්වැඩියාවට හා ගස් කැපීමේ කාර්යය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි වී නොමැති බැවින් ප්‍රාදේශීය මට්ටමින් සැපයුම්කරුවන් ලියාපදිංචි කර ගැනීම සුදුසු බව යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.පුෂ්පකුමාර ධනසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ සැපයුම් කරුවන් ලියාපදිංචි කිරීමට අකමැති වන්නේ මෙම කාර්යයන් සිදු කිරීමෙන් පසු ඇතිවන ගැටළු නිසා බවත්, ගස් කැපීමේ කාර්යයයේදී වැඩි අනතුරුදායක තත්වයක් පවතින හෙයින් ඔවුන්ගේ මිළ ගණන වැඩි බවත්,එනිසා ප්‍රාදේශීය සභාවේ සැපයුම් කරුවන් ලියාපදිංචි නොවන බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා පවසන ලදි.

ප්‍රාදේශීය මට්ටමින් සැපයුම්කරුවන් බඳවා ගැනීම හොඳ බවත්, රජයෙන් සභාවට උපකරණ ලබා දීමේදී අනතුරුදායක ගස් ඉවත් කිරීමට බකට් ලොරියක් ඉල්ලීමක් කර ලබා ගන්න පුළුවන්නම් වැඩදායක බවයි.එවිට අනතුරුදායක ගස් ඉවත් කරන විට සභාවේ කම්කරුවන් යොදා ගස් වල අතු කපා ඉවත් කිරීමට හැකියාව ඇත.එවිට ගස් රැක ගැනීමට හැකිය.මේ මඟින් ප්‍රධාන පාර දෙපස අනතුරුදායක ගස් වල අතු කපා ඉවත් කිරීමට හැකියාව පවතී.රජයෙන් ඉල්ලීමක් කර සභාවට බකට් ලොරියක් ලබා ගැනීමට කටයුතු කරන ලෙසට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා ඉල්ලීමක් කරන ලදි.

**තීරණ අංක 07**

2026 වර්ෂයට අදාළව ගාස්තු අය කර ගැනීමකින් තොරව ට්‍රැක්ටර් රථ ඇතුළු වාහන අලුත්වැඩියාවට හා ගස් කැපීමේ කාර්යය ප්‍රාදේශීය මට්ටමින් සැපයුම්කරුවන් ලියාපදිංචි කර ගැනීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

02.ගල්ලෙපිට ආදාහනාගාරයට අවටින් ඇති පතල් හිමිකරුවන් විසින් සිදු කරනු ලබන පතල් කැණීම් මතින් ආදාහනාගාර භූමියට ඇතුල් වී ඇති බවට විශ්වාසණීය ආරංචි මාර්ග වලින් දැනුවත් වී ඇති බැවින් හා මින් පෙරද එසේ සිදු වී ඇති බැවින්ද ඉතා කඩිනමින් බැකෝ යන්ත්‍රයක් හා අවශ්‍ය උපකරණ භාවිතා කර මැණික් සංස්ථාවේ අධීක්ෂණය හා උපදෙස් මත ආදාහනාගාර භූමියේ පතල් කැණීම් සහිත මායිමේ කැණීමක් සිදු කර පරීක්ෂණයක් සිදු කිරීමට කාර්මික සේවා කමිටුව යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.පුෂ්පකුමාර ධනසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ වන විට සභා සීමාවේ පතල් 01ක් වැඩ කරන බවත් කළින් පතල් 03ක් වැඩ කළ බවත්,ලද ආරංචි මාර්ග අනුව බැහැපු වළට වඩා සභා සීමාවේ ඇති ඉල්ලම් ගැඹුරින් අඩු බවත්, සාමාන්‍යයෙන් අඩි 15 පමණ යටින් දෝනා තියෙන බවත්,අප සංස්ථාව සමඟ මැදිහත් සභා සිමාව කෙරවලේ බැකෝ යන්ත්‍රයක් යොදා දෝනා පාදන්නන පුළුවන් බවයි.එවිට සභා භූමියට ඇතුලත් වූ ඇති දෝනා වලට දඩයක් නියම කළ හැකි බවයි.ඒ පදනමින් යෝජනාව ඉදිරිපත් කළ බවත් එවිට සියලු දෝනා එළියට ඇදගත හැකි බවත් එවිට කපන එකත් නවතින බවත් කරපුවට දඩුවම් දිය හැකි බවත්,නැතිනම් දඩයක් නියම කළ හැකි බවයි.කෙසේ වෙතත් ලැබුණ තොරතුරු අනුව බැකෝ එකකින් වළක් හැරුවා කියලා ආදාහනාගාරයට හානියක් නොවන බවත් විශාල ගලකින් ආදාහනාගාරය ආවරණය වී ඇති බවයි.සුදුසු ක්‍රමයකට මෙම කටයුත්ත අවසන් කළ යුතු බවයි. ලැබුණ තොරතුරු අනුව දෝනා වහළවල් වැඩි ගැඹුරකින් පිහිටා නොමැති බවත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.ඒ.ඉසුරු සම්පත් අලගියවන්න මැතිතුමා පවසන ලදි.

මේ සම්බන්ධයෙන් සභාවක් ලෙස මැදිහත් වී කඩිනම් පියවරක් ගත යුතුය.මේ වන විටත් ලැබුණ තොරතුරු අනුව විශාල වටිනාකමින් යුත් මැණික් හමු වී ඇති බවත් එයට සාක්ෂි ලෙස දැනට ස්වර්ණාභරණ හා මැණික් අධිකාරියේ පවතින මැණික් ගල් වලින් තහවුරු වේ.මෙසේ දෝනා හාරා අපගේ භූමියට අතුල්වන්නන්ට දඩුවමක් ලබා දිය යුතු බැවින් මේ සඳහා නිසි ක්‍රමවේදයක් සකස් කළ යුතු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා පවසන ලදි.

පසුගිය සභා වාර වලදී මේ සම්බන්ධයෙන් කතා කලත්,තවම මෙම කටයුත්ත නැවති නැති බවත් මැණික් සංස්ථාවෙන් ඇවිත් පරික්ෂා කරනවා දෝනා වල යනවා නමුත් තවත් ඒ කාර්යය සිදුවෙනවා.ආදාහනාගාරයේ බැකෝ යන්ත්‍රයක් යොදා යටින් වළක් හැරුවොත් නාය යාම් අවධානමකට ලක් විය හැකි බවය. බැකෝ යන්ත්‍රයක් යොදා හාරනවා සේම මැණික් සංස්ථාවෙන් අවසර ගෙන ඒ හා සමානව අයින දිගේ සෝදිසි වළවල් දැමීමත් එවිට ආදාහනාගාරයට දෝනා එන්නේ නැති බවත් ඒ පැමිණියත් අපේ වළවල් හරහා පැමිනිය යුතුය.අපේ දේපළ ආරක්ෂා කළ යුතුය.වැස්සත් එක්ක නාය යාම් අවධානමක් ඇති බැවින් NBRO වාර්තාවක් ලබා ගන්න.සුදුසුම දෙය සෝදිසි වළවල් බවත් මන්ද බැකෝ කරද්දී දෝනා වළවල් වැසී යාමට වැඩි ඉඩකඩක් ඇති බවයි. සෝදිසි වළවල් යෙදීමේදී අධීක්ෂණයක් සිදු කළ හැකි බවත්,තියෙන දෝනා මතු විය හැකි බවය.මෙම කාර්යයට වැඩි වියදමක් නොයන බවත්ය.තවද NBRO වාර්තාවක් අරගෙන නාය අවධානමට ලක් නොවන බවට සහතිකයක් ලබා ගත හැකි නම් බැකෝ යන්ත්‍රයක් යොදා යටින් වළක් හැරීම ප්‍රශ්නයක් නොමැති බවත්,එසේ හැකියාවක් නොමැති නම් සෝදිසි වළවල් යෙදීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා පවසන ලදි.

අවසරයක් රැගෙන සභාවෙන් පතල් කැපීම සුදුසු බවත්,නැතිව මෙම කටයුත්ත නැවැත්විය නොහැකි බවය.සෝදිසි වළවල් යෙදූ විට එහි ඉල්ලම් නොගනීද? යන්න ප්‍රශ්නයක් බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා පවසන ලදි.

විපක්ෂනායක තුමා පවසන පරිදි ආදාහනාගාර භූමිය නාය අවධානම් බැවින් නායක් ගියහොත් ඒ සම්බන්ධව අපට වගකීමට සිදු වන බවයි.සෝදිසි වළවල් සැක තැන් වල හෑරීම සුදුසු බවත් එවිට එම දෝනා හමු වුනොත් එහි හිමිකරුවන්ට විරුද්ධව නඩු දැමිය යුතු බවත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජු ඩයස් වික්‍රමනායක මැතිතුමා පවසන ලදි.

ආදාහනාගාරය පිහිටා තිබෙන්නේ බෑවුමක හෙයින් අනිවාර්යයෙන්ම පතල් වලින් දෝනා එනවනම් සභාවක් විදයට අවශ්‍ය පියවර අරගෙන ඒක නැවැත්විය යුතු බවත්,මෙය සිදු කළ යුත්තේ අපේ සම්පත රැක ගනිමින්ය.මුලින්ම භූ විෂමතාවය අනුව ආදාහනාගාරයට හානියක් වනවාද යන්න සොයා බැලීමක් සිදු කර පියවර යුතුයි.භූ විෂමතාවය අනුව ඉහළම ස්ථානයේ ආදාහනාගාරය පිහිටා තිබේ.අප මොන ක්‍රියාමාර්ගයක් ගත්තත් සභාව සතුව පවතින වටිනාම සම්පත වන ආදාහනාගාරය ආරක්ෂා වන ආකාරයට සුදුසු පියවරක් ගත යුතු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.නිශාන්ත කුමාර බුද්ධාරච්චි මැතිතුමා පවසන ලදි.

සභාපතිතුමාගේ බලතල ක්‍රියාත්මක කර සංස්ථාව හා එක්ව සභාවේ කෙනෙක් බස්සවා තහනම් ගහල අවශ්‍ය දඩයක් නියම කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා උප සභාපති එච්.ජී.නලින් සේනක මාගම්මන මැතිතුමා පවසන ලදි.

ක්ෂණික පියවරක් ලෙස පරීක්ෂා කර බලා වාර්තාවක් එනතුරු අපේ භූමියට දෝනා එන බවත්, මෙම පතල් නවත්වන ලෙස මැණික් සංස්ථාවට පැමිණිල්ලක් ඉදිරිපත් කළ යුතු බවත්,තවමත් දෝනා එනවනම් තාවකාලිකව බලපත්‍රය අත්හිටුවීමත් සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා පවසන ලදි.

<u>**තීරණ අංක 08**</u>

පතල් දෝනා ගමන් කිරීම පිළිබඳ නැවත මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය වෙත පැමිණිළි කර අදාළ ක්‍රමවේදයන්ට අනුව පතල් පරීක්ෂා කර නිරීක්ෂණයට අදාළ නෛතික කටයුතු කර තාවකාලිකව පතල් නැවැත්වීමටත් ,අදාළ පතල් හිමියන් විසින් සිදු කර ඇති හානිය විධිමත් නිරීක්ෂණය කිරීමට මීට අදාළ වන සියලුම රාජ්‍යය ආයතන මැදිහත් කර ගැනීමෙන් අනතුරුව ලබා දෙන නිර්දේශයන්ට යටත්ව වඩාත් යෝග්‍යය ක්‍රමවේදයට අනුව බැකෝ යන්ත්‍රයක් යොදා හෝ සෝදිසි වළවල් යොදා කැණීමක් සිදු කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

03.ප්‍රධාන අමාත්‍යාංශයෙන් ලද සම්පීඩනතා අච්චු ( පරීක්ෂණ කැට ) කුලියට ලබා දීමේදී එක් අච්චුවක් සඳහා දිනකට මිලක් අය කර ගැනීම සුදුසු බවට ලද යෝජනාව සම්බන්ධයෙන් සුදුසු තීරණයක් ලබා ගැනීමට ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.පුෂ්පකුමාර ධනසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

කොන්ත්‍රාත් කරුවන් කොන්ත්‍රාත් නොකරන තත්වයට පත්වී ඇති හෙයින් සම්පීඩනතා අච්චු කුලියට නොදී නොමිලේ ලබා දීම තුලින් කොන්ත්‍රාත් කරුවන් දිරි ගැන්වීමක් සිදු කළ හැකි බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා පවසන ලදි.

මෙහි ප්‍රායෝගික ප්‍රශ්නය වන්නේ මෙම අච්චු නැවත භාර නොදීම හා භාරදීමට ගත වන කාලය වැඩි වීම මත නැවත සම්පීඩනතා අච්චු ලබා ගැනීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතු බව ගරු ප්‍රාදේශීය සභා සභාපති එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමා පවසන ලදි.

මෙම සම්පීඩනතා අච්චු ලබා දීමේදී කොන්ත්‍රාත්කරුගෙන් ,මෙම අච්චු ලබා දෙන අවස්ථාවේදී ව්‍යාපෘති අවසන් වූ පසු අච්චු ලබා දීමට ප්‍රමාද වුවහොත් ඇප මුදල් වලින් එම මුදල ලබා ගැනීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.ඒ.ඉසුරු සම්පත් අලගියවන්න මැතිතුමා පවසන ලදි.

කොන්ත්‍රාත් ගිවිසුමට අමතරව මෙම අච්චු ලබා දීමේදී නව ගිවිසුමක් අත්සන් කර වැඩ ආරම්භ කරන දවස් 5-6කට නොමිලේ ලබා දී ඉතිරි දිනවලට රු.100.00ක මුදලක් ලබා ගැනීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්.ඉන්දික ගයාන් ලියනගේ මැතිතුමා පවසන ලදි.

කොන්ත්‍රාත්කරුට දවස් 10ක් උපරිමය කල් දීමටත්,දවස් 10ක් සභාව යටතේ සිදු කරන ව්‍යාපෘතියක් නම් නොමිලේ ලබා දීමටත්,සභාවෙන් පිට සිදු කරන ව්‍යාපෘතියක් නම් රු.100.00 බැගින්ද දවස් 10න් පසුව සභාව යටතේ සිදු කරන ව්‍යාපෘතියක් නම් සභාව යටතේ සිදු කරන ව්‍යාපෘතියක් නම් රු.250.00ක්ද දිනකට අය කළ යුතු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.පුෂ්පකුමාර ධනසේකර මැතිතුමා පවසන ලදි.

නමුත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා පවසා සිටියේ සභාව හරහා සිදු කරන ව්‍යාපෘතියක් වුවත්,එය කොන්ත්‍රාත් පදනමින් සිදු කරන නිසා මුදලක් ලබා ගත යුතු බවය.

<u>**තීරණ අංක 09**</u>

සම්පීඩතා අච්චු ලබා දීමේදී එක් අච්චුවක් සඳහා දිනකට රු.100.00ක මුදලක් අය කර ගැනීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

<u>**IV.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.චන්ද්‍රලාල් ජයරත්න මැතිතුමාගේ යෝජනා.**</u>

01.ගල්ඉන්න ග්‍රාම නිලධාරී වසමේ යෞවන සමාජ ක්‍රීඩා පිටියේ පස් කපා ඉවත් කිරීම සඳහා බැකෝයන්ත්‍රය ලබා දෙන ලෙස ඉල්ලා සිටිමි.(මෙය ගම්වාසීන්ගේ ඉල්ලීමකි)

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.මොහාන් මංජුල මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 10</u>**

ස්ථානීය පරීක්ෂණයක් සිදු කර ලැබෙන නිර්දේශ අනුව ඉදිරි කටයුතු සිදු කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

02.ගල් ඉන්න ග්‍රාම සේවා වසමේ පැල්වාඩිය බේකරිය අසළින් පොල්ගහතැන්න දෙසට යන මාර්ගයේ දකුණු පැත්තට ඇති අතුරු මාර්ගය (ඩී.කේ.විජේදාස මහතාගේ නිවස දෙසට)හියුම් පයිප්ප යොදා දෙපස පැති බැම් 02ක් ඉදි කිරීමට යෝජනා කරමි.(මෙම ස්ථානයට හියුම් පයිප්ප ගිය වර සභා වාරයේදී ඉල්ලා ඇත.)

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.මොහාන් මංජුල මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ලබා දෙන ලද බෝක්කුව අදාළ ස්ථානයේ සවි වනවාද යන්න පසු විපරමක් ලබා ගත යුතු බවත්,සභාව මගින් සිලින්ඩරය පමණක් ලබා දෙන්නේද ඉදිරි කටයුතු සිදු කරන්නේ කවුරුන්ද යන්න සොයා බැලිය යුතු බවත්,මෙම බෝක්කු සවි කිරීමේදී සවි කිරීම සම්බන්ධව නිර්ණායක කිහිපයක් සකස් කර අදාල සමිති වෙත ලබා දිය යුතු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්.ඉන්දික ගයාන් ලියනගේ මැතිතුමා පවසන ලදී.

සිලින්ඩර ලබා දීමේදී එම මාර්ගය භාවිතා කරන පුද්ගල කණ්ඩායම් හඳුනාගෙන අත්සන් ලේඛනයක් ලබා ගත යුතු බවත්, අප ලබා දෙන්නේ සිලින්ඩරය පමණක් බවත්,දෙපැත්තේ බැම්ම ඔවුන් විසින් බැඳගත යුතු බවත්,එම කටයුතු සම්පූර්ණ කිරීමට හැකි නම් පමණක් සිලින්ඩර ලබා දෙන බවත්, ප්‍රජා දායකත්වයෙන් සිදු කිරීමට හැකිනම් පමණක් සිලින්ඩර ලබා දීමටත්,නොමැති නම් ලිඛිත ලියවිල්ලක් ලබා ගැනීමෙන් පසු සිලින්ඩර ලබා දීම සාර්ථක බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා පවසන ලදී.

මෙහි වගකීම අදාළ කොට්ඨාශ වල ගරු මන්ත්‍රීවරුන් හා වරියන් භාර ගත යුතු බවත්,සිලින්ඩර අවශ්‍ය ප්‍රමාණයන් ලබා දෙන ලෙසත් ගරු ප්‍රාදේශීය සභා සභාපති එම්.ජී.ධර්මසිරි මාණිපුර මැතිතුමා පවසන ලදී.

**<u>තීරණ අංක 11</u>**

ස්ථානීය පරීක්ෂණයක් සිදු කර ලැබෙන නිර්දේශ අනුව ප්‍රතිපාදන තත්වය සළකා බලා ඉදිරි කටයුතු සිදු කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

03.මාවුදැල්ල ග්‍රාම සේවා වසමේ පනගම දෙදොළ ගම ඉහළින් ගල් ඇන්දක් පුපුරා මේ වන විටත් ගල් කිහිපයක් පහළට පෙරළී ඇත.මෙය ඉතාමත් අවධානම් සහිත බැවින් ඉක්මනින් ක්‍රියාමාර්ගයක් ගැනීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.මොහාන් මංජුල මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 12</u>**

මෙම ඉල්ලීම සම්බන්ධයෙන් පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ආපදා අංශය වෙත දැනුවත් කිරීම සුදුසු බව ඒකමතිකව සහා සම්මත විය.

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවට මුදල් අය කර ගැනීම ප්‍රමාද වන හෙයින් පොදු වෙළඳපල අංක 14 මාළු කඩ කාමරය සම්බන්ධයෙන් තීරණයක් ගැනීම අත්‍යවශ්‍යම හෙයින් හදිසි යෝජනාවක් ගෙන එන බවට ගරු ප්‍රාදේශීය සභා සභාපති එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමා සභාවට පවසන ලදී.

**හදිසි යෝජනා**

**<u>ගරු සභාපති එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමාගේ යෝජනා.</u>**

01.පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවට අයත් පොදු වෙළඳපල අංක 14 මාළු කඩ කාමරය 2026 වර්ෂයට බදු ලබා දීමේදී 2026.01.05 දිනට ඉදිරිපත් කරන ලද ලංසුකරුවන් හා ඉදිරිපත් කර ඇති ලංසු මුදල් පහත පරිදි වේ.

| අනු අංකය | නම | ලිපිනය | ලබා දී ඇති අවම ලංසු මුදල | ඉදිරිපත් කර ඇති ටෙන්ඩර් මුදල |
|---|---|---|---|---|
| 01 | එම්.දිල්රංග ශාන් හංසක මයා | බෝධිය පාර,වැල්ලඳුර,කහවත්ත | රු.420,000.00 | රු.1,950,000.00 |
| 02 | එස්.කේ.ඒ.ඩී.එම්.අකිල සමරසිංහ මයා | අංක 07,සුසිරිගම,ඇල්ලෙගෙවත්ත,කහවත්ත | රු.420,000.00 | රු. 920,500.00 |
| 03 | බී.රුමේෂ් මධුසංඛ මයා | සමඟි මාවත, රිල්හේන ,පැල්මඩුල්ල | රු.420,000.00 | රු. 823,000.00 |
| 04 | ඒ.ඩී.චානක සම්පත් මයා | ආගරේගම, වැල්ලඳුර,කහවත්ත | රු.420,000.00 | රු. 625,000.00 |
| 05 | ආර්.ඒ.දිනේෂා රුවන් කුමාරි අමරසිංහ මිය | බේකරිය අසල පාර, පාතකඩ,පැල්මඩුල්ල | රු.420,000.00 | රු. 471,999.00 |

ඒ අනුව වැඩිම ලංසු මුදලක් ඉදිරිපත් කර ඇති එම්.දිල්රංග ශාන් හංසක මයා විසින් කඩ කාමරය නොගන්නා බවත්,දෙවනුව වැඩි ලංසු මුදලක් ඉදිරිපත් කර ඇති එස්.කේ.ඒ.ඩී.එම්.අකිල සමරසිංහ මයා විසින්ද කඩ කාමරය නොගන්නා බව දන්වා ඇති බැවින් මේ සම්බන්ධයෙන් සුදුසු තීරණයක් ලබා ගැනීම සඳහා ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්.ඉන්දික ගයාන් ලියනගේ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම ටෙන්ඩර් ක්‍රියාපටිපාටිය සිදු කිරීම සඳහා විශාළ වියදමක් දැරීමට සිදුවුව බවත්, එම්.දිල්රංග ශාන් හංසක මයා හා එස්.කේ.ඒ.ඩී.එම්.අකිල සමරසිංහ මයා කඩ කාමරය නොගන්නා බව දන්වා ඇති බැවින් මොවුන් අසාදුගත ලේඛනයට ඇතුලත් කිරීමත්,මොවුන් අවිධිමත් ලෙස ව්‍යාපාර සිදු කර සභාව සතු මාළු කඩයේ මිල ගණන් උපක්‍රමශීලීව අඩු කරන බැවින් නැවත ටෙවන්ඩර් කිරීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා සභාපති එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමා පවසන ලදී.

**තීරණ අංක 13**

බෝධිය පාර,වැල්ලදූර,කහවත්ත ලිපිනයේ පදිංචි එම්.දිල්රංග ශාන් හංසක මයා,අංක 07,සුසිරිගම,ඇල්ලෙගෙවත්ත,කහවත්ත ලිපිනයේ පදිංචි එස්.කේ.ඒ.ඩී.එම්.අකිල සමරසිංහ මයා යන පුද්ගලයන් දෙදෙනා අසාදුගත ලේඛන ගත කිරීමටත්, පැල්මඩුල්ල නගරයේ අනවසර ලෙස වෙළඳාම් කරන අවිධිමත් මාළු කඩ මහජන සෞඛ්‍ය පරීක්ෂක,පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව,පොලිසීය යන ආයතන එක්ව ඉවත් කිරීමටත්, පොදු වෙළඳපල අංක 14 මාළු කඩ කාමරය නැවත ටෙන්ඩර් කිරීම සුදුසු බව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමාගේ යෝජනා.**

01.ග්‍රාමීය මට්ටමේ මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් විධිමත් කිරීම සම්බන්ධව පොලීසිය හා සභාව මැදිහත් වී කටයුතු කිරීමට වැඩපිළිවෙළක් සකස් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ග්‍රාමීය මට්ටමින් මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහනක් පැවැත්වීම අවශ්‍ය බවත්,මෙම මත්ද්‍රව්‍ය හේතුවෙන් බෝපැත්තේ පුද්ගලයන් දෙදෙනෙකු මියගොස් ඇති බවත්,වතු නිවාස ආශ්‍රිතව මෙම කටයුත්ත සිදු වන බැවින් සුදුසු ක්‍රමවේදයක් සකස් කරන ලෙසත්,සම්බන්ධීකරණ රැස්වීම සඳහා අපේ මන්ත්‍රීවරුන්ට සහභාගී වීමට අවස්ථාව සළසා දෙන ලෙසත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා පවසන ලදි.

**තීරණ අංක 14**

බෝපැත්ත කොට්ඨාශය හා පැල්මඩුල්ල නගරය මුල් කොටගෙන මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහනක් පොලීසිය සමඟ එක්ව සාකච්ඡා කර වැඩපිළිවෙළක් සකස් කිරීම සුදුසු බව ඒකමතිකව සභා සම්මත විය.

කසළ රැස් කරන ට්‍රැක්ටර් සඳහා හෝන් සවි කිරීමටත්,අනවසර ඉදි කිරීමක් ඉවත් කිරීමට යාමේදී එම ඉදි කිරීම සම්බන්ධයෙන් මුල සොයා බැලිය යුතු බව ගරු ප්‍රාදේශීය සභා උප සභාපති එච්.ජී.නලින් සේනක මාගම්මන මැතිතුමා පවසන ලදි.

මාර්ග එළිපෙහෙළි කිරීම සඳහා කණ්ඩායමක් සූදානම් කර ඇති බැවින් ඒ සම්බන්ධ විෂය නිලධාරී ළඟ ඇති පොතෙහි මාර්ග එළිපෙහෙළි කිරීමට අවශ්‍යය ස්ථානය සඳහන් කරන ලෙසත් ප්‍රමුඛතාගත පිළිවෙළට මෙම කාර්යය සිදු කරන බවත් ගරු ප්‍රාදේශීය සභා සභාපති එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමා පවසන ලදි.

හිටපු අමාත්‍ය දුනේශ් ගන්කන්ද මැතිතුමාගේ නිවස අසළ කෝබ්‍රා විදුලි පහනක් සවි කර ඇතත් දැන් විදුලි පහන ක්‍රියාකාරීත්වයේ නොපවතින බැවින් එම ස්ථානය මත්ද්‍රව්‍ය හුවමාරු කරන ස්ථානයක් වී ඇති බැවින් එම ස්ථානයට විදුලි බල්බයක් සවි කරන ලෙසත්,පොල අසළ වැසිකිළිය ළඟ වීදි පහනට බල්බ් එකක් සවි කරන ලෙසත්,ගංවතුර කාලයේදී දෙනවක ගඟෙහි ආපු කුණු රොඩු එකතු වී ඇති බැවින් එම කුණු රොඩු ඉවත් කිරීමට අවශ්‍යය කටයුතු සළසා දෙන ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී එම්.එස්.එස්.මාකාවිට මැතිනිය පවසන ලදි.

පාතකඩ පුස්තකාලය අසළ ගමම භාවිතා කරන ළිඳක් ඇති බවත්,ළිඳ ළඟ මාර්ගය සංවර්ධනය කිරීමේදී ළඳට හානියක් සිදු වන පරිදි එම සංවර්ධන කාර්යය සිදු වී ඇති බවත්, ළිඳට හානියක් නොවන පරිදී මෙම කාර්යය සිදු කරන ලෙස සියලු ගම් වාසීන් ඉල්ලා සිටින බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.නිශාන්ත කුමාර බුද්ධාරච්චි මැතිතුමා පවසන ලදි.

මේ සම්බන්ධයෙන් ලිපියක් ලැබී ඇති බවත්, කාර්මික නිලධාරී ස්ථානීය පරීක්ෂණයක් සිදු කර ඇති බවත්,මෙම කාර්යය සිදු කිරීමේදී සභාව ලෙස එය නැවැත්වූ බවත්,නැවත එය සකසා ඇති බවත්,ළිඳ සහ මාර්ගය සභාවට අයිතියක් නොමැති වුවත් මෙම ළිඳ සකස් කිරීම සභාව උදව් කර ඇත.මේ සම්බන්ධයෙන් 12වැනිදා පරීක්ෂණයක් පවත්වන බවත්,මෙහි නිතිමය තත්වයක් ඇති බවත් ගරු ප්‍රාදේශීය සභා සභාපති එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමා පවසන ලදි.

සභාවෙන් මුදල් වියදම් කර ඇත්නම් මෙම ළිඳ පොදු විය යුතුය.මන්ද පෞද්ගලික දෙයකට සභාවේ මුදල් වියදම් කළ නොහැක.එසේ නම් එය සභාව සතු විය යුතු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා පවසන ලදි.

**07.කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම - නැත**

**08.ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ,එකතු කළ ආදායම පිළිබඳ ප්‍රගති වාර්තා ගරු සභාවට ඉදිරිපත් කිරීම.**

2025.12.01 සිට 2025.12.31 දක්වා මාසයට අදාළ වූ සභාවේ ගෙවීම් වාර්තාව අනුමත කිරීම හා ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ,එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තාව සභා ගත කරන ලදි.

වීදි පහන් සවි කිරීම සඳහා කිහිප සැරයක් වීදි පහන් මිළදී ගෙන ඇතත් ඒවා සවි කිරීම් හා නඩත්තුව පිළිබඳ විධිමත් වාර්තාවක් සකස් කළ යුතු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා පවසන ලදි.

වීදි පහන් සවි කිරීමේදී අදාළ සීරියල් අංකය සඳහන් කරගන්නා බවත්, සවි කරන ස්ථානය අසළ ඇති නිවසක දුරකථන අංකය පවා ලබා ගන්නා බවත් දැනට වීදි පහන් හාරසියයක ප්‍රමාණයක් සවි කර ඇති බවත්,තවත් 250ක ප්‍රමාණයක් ලැබීමට නියමිත බවත්,අංක කිරීම විදි පහන් සවි කිරීමෙන් පසුව වැඩපිළිවෙළක් සකස් කරන බවත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා පවසන ලදි.

**වෙනත් කරුණු**

- **සභිකවරුන්ගේ පෞද්ගලික පැහැදිලි කිරීම්.**

- **<u>සභාපතිතුමාගේ ස්තුති කිරීම.</u>**

අද දින සභාවට පැමිණ සිටින ගරු උප සභාපතිතුමන් ගරු විපක්ෂනායකතුමන් ඇතුළු පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රී තුමන්ලාට හා මන්ත්‍රී තුමියන්ලාටත් , ලේකම්තුමන් ඇතුළු කාර්ය මණ්ඩලයේ සියලු දෙනාට ස්තුතිය පුද කරමින් ගරු සභාපතිතුමාගේ ස්තුති කතාව අවසන් කරන ලදී.

- ප.ව.12.40 ට පමණ සභාවේ කටයුතු අවසන් විය.
- 

  ගරු ප්‍රාදේශීය සභා ..................................................................... මැතිතුමා/මැතිතුමිය ගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා ........................................................................ මැතිතුමා/මැතිතුමිය ගේ ස්ථිරත්වයෙන් සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත විය.

2026-03-11 වන දින
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේදී ය.

සභාපති
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව